# අඛණ්ඩ ගුරු අධ්‍යාපනය ලබාදීම සඳහා ඇති කරන ලද ගුරු මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්...


**එස්. අබේසිරිවර්ධන**

ශාස්ත්‍රවේදී උපාධි (B. A.)
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (NIE)
පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ වි. වි)
අධ්‍යාපනපති උපාධිය (MeD)



UCLIB
539534


කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති පශ්චාද් උපාධියේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරන විමර්ශනාත්මක නිබන්ධනය

**2002 / 2004**

# ABSTRACT

The teacher is one of the main factors effecting qualitative development in education. It is through teacher education that a teacher becomes a professional.

The history of education in Sri Lanka indicates that teachers have been trained variously, using different modes, overtime. with the introduction of educational reforms in 1988, to overcome existing limitations in teacher training, a new structure was introduced for the continuing education of teachers, namely, teacher centres. However, there are differences in opinion whether the reforms have effected the changes needed by the system and teachers. The present research was designed to analyse the state of the scene. The main objective of the research study was to conduct an analytical investigation into the functioning of Teacher Centres set up to provide continuing education to teachers.

The teacher centres are expected to pioneer innovation and qualitative development in providing continuous training and education to teachers throughout their period of service. The research problem is whether this institution put in place to provide continuing teacher education has effectively functioned in that role. The research was guided by a number of objectives designed to ascertain this. The concept underlying this innovation, the proposed structure and teacher education policies were first probed. A relative analysis of the functions proposed for teacher centres and those implemented, was undertaken. planning of programmes, selection of personnel, the implementation of programmes were inquired into. Conducting a survey of attitudes of teachers on continuing education and, problems encounted in providing teacher education through teacher centres was another objective of the research. The last objective was to ascertain whether the Teacher Centre system can be used effectively to deliver continuing teacher education to all teachers. Drawing on a comparative analysis of similar programmes being conducted overseas and the findings of the present research, suggestions were made for improvement.

The Samples of this study comprised the teacher centres and designated personnel in the Southern province. The instruments of data collection e were questionnaires, interview schedules and an attitude scale. The records maintained by the teacher centres and other relevant documents were also perused to gather data. The research data were analysed descriptively and statistically.

The findings indicate that Teacher Centre structure as implemented differs from the proposed structure, which has resulted in a number of constraints. Lack of national level coordination, monitoring at national or provincial level, quality control are some of the main areas of concern. one cause for this state of affairs is that the National Authority on Teacher Education (NATE) set up to carry out these functions has become defunct. Some limitations in implementation are also indicated, in the findings. Human resource and financial constraints are some of the main problems that Teacher Centres confront. Academic and non academic staff appointments have not been effected, as proposed. There is the complaint that financial allocations to conduct programmes do not reach the Centres in time and that there are physical resource constraints.

To overcome these limitations and constraints, the following recommendations have been made. It is proposed that the need for national and provincial level coordination, an effective system of supervision (at national and provincial level), timely provision of financial resources, in particular, decentralization of financial provision, appointment of the required staff cadre should urgently be addressed.

## සාරාංශය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනයට බෙහෙවින් ඉවහල්වන සාධකයෙකි. ගුරුවරයා. ගුරුවරයා අධ්‍යාපඥභාවය ලබන්නනේ ගුරු අධ්‍යාපනය තුලිනි. ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය දක්වන පරිදි ඓතිහාසිකව ගුරුවරයාට විවිධ පුහුණුවීම් ලබාදී ඇත. 1998 හඳුන්වාදුන් නව ප්‍රතිසංස්කරණ තුලින් ගුරු පුහුණුවේ අඩුපාඩු මගහරවාලමින් ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නව සංකල්පයක් ලෙස අඛණ්ඩ ගුරු අධ්‍යාපනය හා ගුරු මධ්‍යස්ථාන ක්‍රියාවලිය වැදගත්වේ. එම ප්‍රතිසංස්කරණ තුලින්ද ගුරුවරයාට සහ පද්ධතියට අවශ්‍ය යෝජිත කාර්යභාර ඉටුවූයේද යන්න පිළිබඳ විවිධ මත පවතී. එම තත්ත්ව පිළිබඳ විග්‍රහයක් කිරීමේ අරමුණින් වර්තමාන පර්යේෂණය සැලසුම් විය. පර්යේෂණ අරමුණ, අඛණ්ඩ ගුරු අධ්‍යාපනය ලබාදීමට ඇති කරන ලද ගුරු මධ්‍යස්ථාන වල ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීමය.

රජයේ ගුරුවරුනට වෘත්තිය ජිවිතය පුරා නිරන්තර පුහුණුවක් / අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කළ මෙම වැඩ පිළිවෙල හා බැඳුනු ගුරු මධ්‍යස්ථානද ක්ෂේත්‍රය තුළ නව්කරණ හා ගුණාත්මක සංවර්ධනයකට පුරෝගාමී වීම අපේක්ෂිතවේ. පර්යේෂණ ගැටලුව වූයේ අඛණ්ඩ ගුරු අධ්‍යාපනය ලබාදීම සඳහා ස්ථාපිත කල ආයතන සහ ඒවායෙහි කාර්ය නිසි අයුරින් ඉටුවේද යන්නය.

මෙය තහවුරු කර ගැනීමේ අදහසින් පර්යේෂණය අරමුණු කිපයක් ඔස්සේ මෙහෙයවනු ලැබිණි. නව්කරණ සංකල්පයේ පදනම හා ව්‍යුහය හඳුනා ගැනිම වැදගත් වේ. මේ යටතේ ගුරු අධ්‍යාපන ප්‍රතිපත්ති, නව සංකල්පයේ ප්‍රතිපත්ති හඳුනා ගැනිම පළමුව සිදුකෙරේ. යෝජිත ව්‍යුහයේ කාර්යභාරය හා ක්‍රියාත්මක කිරීමේදී ඉටු කර ඇති කාර්යභාරයද සාපේක්ෂ ලෙස විමර්ශනයට ලක්වේ. පාඨමාලා සකස් කිරීම, සුදුස්සන් තෝරාගැනිම, පාඨමාලා ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයා බැලීමද අරමුණු කොට ඇත. අඛණ්ඩ ගුරු අධ්‍යාපනය පිළිබඳ ගුරු ආකල්ප හා ගුරු මධ්‍යස්ථාන තුලින් ගුරු අධ්‍යාපනය ලබාදීමේදී ඇතිවූ ගැටළු හඳුනා ගැනිමද, ප්‍රධාන අරමුණු අතර වේ. ගුරු මධ්‍යස්ථාන වැඩ පිළිවෙල අධ්‍යාපන පද්ධතියට ඵලදායි ලෙස යොදාගනිමින් සියළු ගුරුවරුනට එමගින් ප්‍රායෝගික ලෙස අඛණ්ඩ අධ්‍යාපනය දිමට හැකිද යන්න සලකා බැලීම අරමුණු අතර ප්‍රධාන තැනක් ගනී. මේ හා සමාන විදේශිය වැඩ සටහන්

සමග සසඳමින් පර්යේෂණ අනාවරණ හා සාපේක්ෂව එලදායි යෝජනා දැක්වීම අවසාන අරමුණ වේ.

පර්යේෂණ නියැදිය දකුණු පළාතේ ගුරු මධ්‍යස්ථාන මුල්කරගත් අධ්‍යාපන ආයතන, පුද්ගලයන්ගෙන් සමන්විත වූවකි. ප්‍රශ්නාවලි සම්මුඛ සාකච්ඡා නියමාවලි හා ආකල්ප පරිමාන පරීක්ෂණ යොදා ගනිමින් දත්ත හා තොරතුරු සපයාගනු ලැබිණි. අදාල ආයතන සතු වාර්තාගත ලේඛනද උපයෝගි කර ගැණිනි. පර්යේෂණ දත්ත හා තොරතුරු විස්තරාත්මක හා සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම මගින් විශ්ලේෂණය කරනු ලැබිණි.

යෝජිත හා ක්‍රියාත්මක ව්‍යුහ සංගත නොවීමේ හේතුවෙන් ගැටලු කිපයක් මතුවී ඇති බව පර්යේෂණ අනාවරණ තුලින් දක්නට ලැබිණි. ඒ අතර ජාතික මට්ටමේ සම්බන්ධිකරණයක්, ජාතික හෝ පළාත් මට්ටමේ නියමනයක්, ප්‍රමිතිකරණයක් මනා ලෙස නොවීම ප්‍රධානවේ. මෙසේ වීමට හේතු අතර ජාතික ගුරු පුහුණු අධිකාරියේ (NATE) කාර්යභාර ගිලිහියාම (අක්‍රියවීමෙන්) පෙන්වාදිය හැක. ක්‍රියාත්මක තත්වයේ පවතින අඩුපාඩු කිපයක්ද පර්යේෂණ අනාවරණ තුලින් දක්නට විය. මානව සම්පත් ගැටළු හා මූල්‍යමය සම්පත් ගැටලු ඒ අතර ප්‍රධාන වේ. යෝජිත ව්‍යුහයට අනුව ගුරු මධ්‍යස්ථානවලට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල අවශ්‍ය පරිදි පත් කිරීමට නොහැකිවීම ඒ අතර වේ. වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලධන ප්‍රතිපාදන නිසිකලට ලබාදීම, සමහර භෞතික සම්පත් ලබාදීම අතින්ද ගැටලු මතුවී ඇත.

පර්යේෂණ අනාවරණ තුලින් දක්නට ලැබූ ඌණතා මගහරවා ගැනීම සඳහා ජාතික හා පළාත් මට්ටමේ සම්බන්ධිකරණයක්, ස්ථාපිත කිරීම, මනාවූ අධීක්ෂණ ක්‍රියාවලියක් ඇති කිරීම (ජාතික හා පළාත් වශයෙන්) නිසිකලට මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා ඒවා විමධ්‍යගත කිරීම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී සැමට සරිලන අයුරින් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කිරීම නොපමාව කල යුතු බවට යෝජනා කිපයක්ද පර්යේෂණය අවසානයේ ඉදිරිපත් කර ඇත.